අටවැනි ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනික පසුබටතාව කෙරෙහි බලපාන සමාජයීය හා ආර්ථික සාධක පිළිබඳව ගාල්ල අධ්‍යාපන මණ්ඩලය ඇසුරෙන් කෙරෙන විමර්ශනයක්.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ අධ්‍යාපන පීඨයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධනය.

REMO..D
FROM THE
LIBRARY

චූලංගනී වික්‍රමසිංහ ජයසේකර

1981 මාර්තු

UCLIB
376908

## සාරාංශය.

ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසැල් සිසුන්ගේ අධ්‍යාපනික පසුබටතාව කෙරෙහි බලපාන සමාජයීය හා ආර්ථික සාධක පිළිබඳ විමර්ශනයක් කිරීමේ අවශ්‍යතාව බුද්ධිමතුන්ගේ අවධානයට වහා යොමු විය යුතු අවධියකට එළඹ ඇත. මෙහිලා අල්පමාත්‍ර වශයෙන් හෝ සහභාගි වීමේ අරමුණින්, ගාලු අධ්‍යාපන මණ්ඩලයේ අටවැනි ශ්‍රේණියේ සිසුන් 450 දෙනෙකු පිළිබඳව කරන ලද සමීක්ෂණයක ප්‍රතිඵල මෙහි අන්තර්ගතය.

මෙම කාර්යයෙහි දී, අධ්‍යාපනික පසුබටතාව නිර්වචනය කළ ආකාරය, එම සංකල්පයේ විකාශනය හා වර්ගීකරණයන්ද පිළිබඳ පසුබිම් අවබෝධය සඳහා සුප්‍රකට මනෝවිද්‍යාඥයන් වන සිරිල් බර්ට්, ෆ්‍රෙඩ් ෂොනෙල්, ඒ ස්ටෝන්ස්, වැන්ස්ලි සහ ගලිඩ්පර්ඩ්, ජෝන් හියුස්, ජෙරල්ඩ් හෝ ආදී විශාරදයන්ගේ කෘති අතිශයින්ම උපකාරී විය.

අධ්‍යාපනික පසුබටතාව පිළිබඳ පැරණි නිගමනය වූයේ සහජ බුද්ධි හීනතාවම ප්‍රධාන වශයෙන් ඊට හේතුවන බවය. එහෙත් ඉහළ බුද්ධි මට්ටමක සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් පවා ද්විතීයික අධ්‍යාපනයේදී පසුබටතාවට හසුවී ඇති අවස්ථා පුලහව දක්නට ලැබෙන බැවින් බුද්ධියට බාහිරව, සමාජමය හා ආර්ථික අංශ ගැනද විමසීමට සිදු විය.

මෙම සමීක්ෂණයේදී ගාලු අධ්‍යාපන මණ්ඩලයේ ද්විතීයික පාසැල් වර්ග තුනකින්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් 450 දෙනෙක් යොදවා ගනු ලැබූහ.

1. 1වී වර්ගය :- විද්‍යා, කලා, වාණිජ උසස් පෙළ ශ්‍රේණි සහිත නේවාසික පහසුකම් ඇති පාසැල් (ශිෂ්‍ය ශිෂ්‍යාවන් 150)

2. 1 බී වර්ගය :- විද්‍යා, කලා වාණිජ උසස් පෙළ ශ්‍රේණි සහිත නේවාසික පහසුකම් නැති පාසැල් ( ශිෂ්‍ය ශිෂ්‍යා-වන් 200 )

3. 1 සී වර්ගය :- 10 වැනි ශ්‍රේණිය දක්වා පමණක් පන්ති ඇති පාසැල් ( ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 )

අධ්‍යාපනික පසුබටතාවට ගොදුරුවූ ශිෂ්‍යයන් තෝරා ගැනීම සඳහා, ගණිතය, විද්‍යාව, සිංහල භාෂාව සහ සමාජ අධ්‍යයනය ආශ්‍රිත සාධන පරීක්ෂණයකින් ලත් ලකුණු උපයෝගී කර ගන්නා ලදී. එම ලකුණුවල මධ්‍යස්ථයෙන් පහළ ලකුණු, විෂයන් හතරටම ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සමීක්ෂණයට සහභාගි කර ගනු ලැබූහ. ඉක්බිති, ඔවුන්ගේ පසුබටතාවට හේතුවූ සමාජයීය හා ආර්ථික සාධක තිබේදැයි පරීක්ෂා කිරීමට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලදී. එයින් ලබා ගැනීමට අපේක්ෂිත තොරතුරු මෙසේ සම්පිණ්ඩනය කළ හැකිය.

1. පාඨශාලීය තත්ත්වය.
2. නිවසෙහි ආර්ථික හා භෞතික තත්ත්වයන්.
3. නිවසෙහි බුද්ධිමය හා සංස්කෘතික වාතාවරණය.
4. නිවසෙහි චිත්තවේගී තත්ත්වය.
5. සම වයස් කණ්ඩායම්වල සාමාජිකත්වය.

ඉහත සඳහන් ක්ෂෙත්‍ර සටහේ ලබා ගත් ලකුණු අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහපත් හා අසහපත් වශයෙන් කොටස් දෙකකට-ද, සාධන පරීක්ෂණ වලින් ලබා ගත් ලකුණු අනුව ඉතා දුබල හා දුබල යනුවෙන් කොටස් දෙකකටද, බෙදන ලදහ. ප්‍රතිඵල විශ්ලේෂ-ණයට පෙරාතුව, සියළු ලබා ගත් ලකුණු අනුව අන්‍යොන්‍යතාවය පරීක්ෂා කොට, ශිෂ්‍යයන්, දෙමව්පියන් හා ගුරුවරුන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලද්දේය. අවසාන වශයෙන් සමීක්ෂණ ප්‍රතිඵල, ප්‍රතිශත වශයෙන් ගණනය කරන ලදී.

ප්‍රතිඵල විශ්ලේෂණයෙන් හෙළිවූ කරුණු මෙසේ සාරාංශ කළ හැකි වේ.

ද්විතියික පාසැල් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික පසුබට-තාවට හේතුවූ කරුණු අතරින් ප්‍රමුඛත්වය ලැබුණේ,

1. ආර්ථික දුෂ්කරතාවන් හා
2. දෙමව්පිය දිරි ගැන්වීමේ හෝ අනුබලය හෝ නොලැබීමටයි.

මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිටම, අධ්‍යාපනය අතින් දුර්වල බවක් දක්වා ඇත. මෙම දුර්වල සිසුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු නොවීම නිසා අටවන ශ්‍රේණිය දක්වාම එම දුර්වලතා තව දුරටත් ඔවුන්ගේ අධ්‍යාපන පසුබටතාවට හේතු වී ඇත. එම දුර්වලතාවන්ට පිළියම් යෙදීම අත්‍යවශ්‍යය. දෙමව්පිය දිරි ගැන්වීම ඇති කිරීමට වැඩිහිටි අධ්‍යාපන පහසුකම් තවත් පුළුල් කළ යුතුය. එමෙන්ම ශිෂ්‍යයන්ගේ කටයුතු ඔවුනට පවරා නිහඬ වීමට රජයට මව්පියන්ට හෝ ගුරුවරුන්ට ඉඩ නොදී අධ්‍යාපනඥයන් සිය වගකීම් ඉටු කළ යුතුය. ඔවුනට යථාර්ථය පහදා දී ශිෂ්‍යයන්ගේ අනාගත ශුභ සිද්ධිය උදෙසා මීට ඔබ්බා විශාල සේවයක් ඉටු කළ යුතු බව රටට හඳුන්වා දීම, අධ්‍යාපනඥයන් විසින් පැහැර නොහැරිය යුතු කාර්යභාරයකි. තවත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දස දහස් ගණනකගේ අනාගතය, අඳුරෙන් මුදා ගෙන ආලෝකය කරා යොමු කළ හැක්කේ එවිට පමණකි.